**PPSC Circular No:AD/ENG/Con.Basis/2026/01**

## නැගෙනහිර පළාතේ දෙපාර්තමේන්තු සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ ඉංජිනේරු (සිවිල්) තනතුරට කොන්ත්‍රාත් පදනමින් (පූර්ණ කාලීනව) බඳවාගැනීම

නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/EPC/E/26/PPSC-Gen/24 හා 2026.07.21 දිනැති අනුමැතියට අනුව, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2026.07.31 දිනැති කොමිෂන් සභා තීරණයට අනුව පහත සඳහන් දෙපාර්තමේන්තු සඳහා ඉංජිනේරු (සිවිල්) තනතුරට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනමින් (පූර්ණ කාලීනව) බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ අනුව, මෙම දැන්වීමෙහි සඳහන් සියළු සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් මෙයට අයදුම්කළ හැකිය. සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදුකරනු ලැබේ. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2026.08.28 වේ.

01. තීරණය කර ඇති පුරප්පාඩු හා පුරප්පාඩු පවතින දෙපාර්තමේන්තු පිළිබඳ විස්තර.

| **අංක** | **කාර්යාලය** | **කොන්ත්‍රාත් පදනමින් බඳවාගනු ලබන සංඛ්‍යාව** |
|---|---|---|
| 01 | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | 01 |
| 02 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 01 |
| 03 | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 01 |

**02. කොන්ත්‍රාත් කාලය :**

බඳවාගනු ලබන දින සිට එක් වසරක කාලයක් සඳහා හෝ මෙම තනතුරට ස්ථිර නිලධාරියෙකු පත්කරන තෙක්, මෙයින් පළමුව එළඹෙන දිනය දක්වා මෙම පත්වීම ක්‍රියාත්මක වේ.

**03. සුදුසුකම්**

සාමාන්‍ය සුදුසුකම් :-

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. යහපත් චරිතයෙන් යුතු අයෙකු විය යුතු අතර මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් යුතු අයෙකු විය යුතු අතර තනතුරේ රාජකාරි ඉටුකිරීමට හැකි ශාරීරික යෝග්‍යතාවයකින් යුතු අයෙකු විය යුතුය.

III. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනක (03) කාලයක් නැගෙනහිර පළාතේ අඛණ්ඩව ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.

IV. නිලධාරියා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:17 වගන්තිය යටතේ විධිමත් පරිදි විශ්‍රාම ගන්වා තිබිය යුතුය.

V. අදාල නිලධාරියා විනය හේතුවක්, අකාර්යක්ෂමතාවයක්, අසතුටුදායක සේවාවක් වැනි හේතුවක් මත සේවයෙන් විශ්‍රාම ගන්වා නොතිබිය යුතුය.

VI. අදාල නිලධාරියාගේ විශ්‍රාම ගැනීමට පෙර සේවා කාලය සතුටුදායක බව හා විනය දඬුවම් ලබා නොමැති බව.

**සටහන :** නැගෙනහිර පළාතෙන් ප්‍රමාණවත් අයදුම්පත් නොලැබුණහොත් පමණක් වෙනත් පළාත්වලින් ලැබී ඇති අයදුම්පත් ඉහත 03.III හි සඳහන් කොන්දේසිය සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

04. **වයස :-** අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 65 ට නොවැඩි විය යුතුය.

05. **වැටුප :-** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි සඳහන් විධිවිධාන පරිදි හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි සඳහන් පරිදි මාසික පාරිතෝෂිකය ගෙවනු ලැබේ.

**06. බඳවාගැනීමේ ක්‍රමය :-**

I. මෙම තනතුර සඳහා බඳවාගැනීම, ඉහත සඳහන් පුරප්පාඩු පිරවීමේ අරමුණින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගනු ලබන කුසලතා අනුපිළිවෙළ අනුව සිදුකරනු ලැබේ. **සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ පිළිවෙළ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය අනුව පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත සිදුකෙරේ.**

II. ඉහත සඳහන් බඳවාගැනීමේ ක්‍රමයෙහි යම්කිසි වෙනසක් සිදුකරන්නේනම් මේ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි ගරු ආණ්ඩුකාරතුමන් විසින් තීරණය කරනු ලැබේ.

III. සම්මුඛ පරීක්ෂණයේදී තෝරාගනු ලබන අයගේ නම් ලැයිස්තුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර එහි නිර්දේශය සහිතව ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කරනු ලැබේ.

**07. අයදුම්කිරීමේ ක්‍රමය**

I. ඔබගේ සම්පූර්ණ විස්තර ඇතුළත් (ඉල්ලා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර ඇතුළත් වන පරිදි) ජීව දත්ත වාර්තාවක් තමන් විසින්ම සකසා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි 'ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත, කන්නියා පාර, වරෝදයනගර්, ත්‍රිකුණාමලය' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

II. අයදුම්පත් එවනු ලබන ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරේ AD/ENG/Con.Basis/2026/01 යනුවෙන් සඳහන් කර එවිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් හා අදාල සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ජේ. ලියාකත් අලි,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැ.ප.
2026.08.04